# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,616/23 - 2009 අගෝස්තු 24 වැනි සඳුදා - 2009.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී 4/98

### 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2009 අගෝස්තු මස 21 දින,

කොළඹ,

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

### නියෝග

### I වැනි කොටස

*සාමාන්‍යය*

1. මෙම නියෝග " 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. පනතේ 62 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ (මෙහි මින්මතු 'අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන) රක්ෂණ අරමුදලේ අරමුණ වනුයේ — අරමුදලේ අරමුණ.

(අ) මේ පනතේ 59 වැනි වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවක් අනුව රෙජිස්ටරයේ යම් නිවැරදි කිරීමක් ; හෝ

(ආ) 59 වැනි වගන්තිය යටතේ අධිකරණය විසින් කරන ලද ආඥාවක් අනුව රෙජිස්ටරය නිවැරදි නොකිරීම,

හේතුකොට ගෙන පාඩු හෝ අලාභ දැරීමට සිදුවූ හෝ අගතියට පත් යම් තැනැත්තකු, අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මත රක්ෂණ අරමුදලින් ආණ්ඩුව විසින් හානිපූර්ණය කිරීම වේ.

අරමුදලේ ප්‍රධාන පරිපාලකයා සහ මෙහෙයවන්නා.

3. අරමුදලේ ප්‍රධාන පරිපාලක සහ මෙහෙයුම්කරු හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විය යුතු අතර, ඔහු අරමුදලේ නිසි ක්‍රියාකාරිත්වය පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු ය.

අරමුදල පරිපාලනය කිරීමේ දී කළමනාකරණ මණ්ඩලය සහය විය යුතු බව.

4. (මෙහි මින්මතු 'මණ්ඩලය' යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය අරමුදල ක්‍රියාත්මක කිරීමේ දී පරිපාලනය කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ දී හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට සහය විය යුතු ය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල අධීක්ෂණය කළ යුතු බව.

5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදලේ පරිපාලනය ක්‍රියාත්මක වීම සහ කළමනාකරණය අධීක්ෂණය කළ යුතු ය.

අරමුදලේ ලිපිනය.

6. අරමුදලේ ලිපිනය විය යුත්තේ බත්තරමුල්ල, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුවේ කාර්යාලය යි.

හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ගෙවීම් සහ මුදල් ලැබීම් පිළිබඳ අනුපාතය පාලනය කිරීම.

7. හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අරමුදලේ මුදල්වලට අදාළ ගෙවීම් ප්‍රමාණය සහ අරමුදල විසින් උපයන ලද සහ අරමුදලට ලැබුණ ආදායම පිළිබඳ අනුපාතය වන ගෙවීම් සහ ලැබීම් අනුපාතය පිළිබඳ නිසි පාලනයක් ක්‍රියාත්මක කළ යුතු ය.

අරමුදල් හිඟ වීම හෝ අතිරික්තයක් ඇති වීම සිදු වන අවස්ථාවක දී හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මණ්ඩලය විමසා අවස්ථාවට උචිත පරිදි වූ ක්‍රියා මාර්ගයක් ගත යුතු ය.

හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිසි ගිණුම් පැවැත්විය යුතු බව.

8. හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අරමුදලට මාරු කරන ලද මුදල් සහ අරමුදලින් ගෙවනු ලබන මුදල් පිළිබඳ නිසි ගිණුම් පැවැත්විය යුතු අතර, එවැනි මාරු කිරීම් සහ ගෙවීම් පිළිබඳ සාක්ෂි ප්‍රවේශමෙන් තබා ගත යුතු ය.

හැකි උපරිම ප්‍රතිශතයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළ යුතු බව.

9. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ භාරව සිටින අධ්‍යක්ෂවරයාගේ සහ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ උපදෙස් මත, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අරමුදලේ මුදල්වලින් හැකි උපරිම ප්‍රතිශතයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළයුතු අතර, ද්‍රවශීලතා අවශ්‍යතා, එම සුරැකුම්පත් පාලනය වන නියෝගවලට අනුකූලව සපුරාලිය යුතු ය.

අරමුදලේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳව බැංකුව විසින් දැනුම් දිය යුතු බව.

10. අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ පෙරාතුව වූ මාස හය ඇතුළත කරන ලද ආයෝජන පිළිබඳව එක් එක් වර්ෂයේ ජූලි මස 01 වැනි දිනට සහ ජනවාරි මස 01 වැනි දිනට පෙර බැංකුව විසින් අර්ධ වාර්ෂික ව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය.

විගණනය.

11. අරමුදල වාර්ෂිකව විගණනය කළ යුතු අතර, විගණන වාර්තාව, වාර්ෂික වාර්තාව, ඉදිරිපත් කිරීමෙන් පසු එක් මාසයකට පසුව ප්‍රකාශයට පත් කළ යුතු ය. එම විගණන වාර්තාවට හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පිළියෙල කරන ලද අරමුදල පිළිබඳ වාර්ෂික පරිපාලන වාර්තාව ද අමුණා තිබිය යුතු ය.

පරිපාලන වාර්තාව.

12. හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අරමුදල පිළිබඳ ඔහුගේ වාර්ෂික පරිපාලන වාර්තාව මණ්ඩලය වෙත ද, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව භාරව සිටින අමාත්‍යවරයාගේ ලේකම්වරයා වෙත ද, භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ද, මහබැංකුවේ අධිපතිවරයා වෙත ද, ව්‍යවස්ථාපිතව නියම කර ඇති වෙනත් යම් බලධරයන් වෙත ද, ඉදිරිපත් කළ යුතු ය.

## II වැනි කොටස

### කළමනාකරණ මණ්ඩලය

13. (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදල පිළිබඳ කළමනාකරණ මණ්ඩලයක් තිබිය යුතු අතර, එම මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :– මණ්ඩලය පිහිටුවීම සහ එහි සංයුතිය.

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ;

(ආ) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව භාරව සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ද;

(ඇ) ඉඩම් විෂය භාරව සිටින අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක්;

(ඈ) මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන එම බැංකුවේ නියෝජිතයෙක් ; සහ

(ඊ) ප්‍රධාන තක්සේරුකරු.

14. මණ්ඩලයේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :– මණ්ඩලයේ කර්තව්‍ය.

(අ) සමස්ත වශයෙන් අරමුදලේ කළමනාකාරිත්වය සහ පරිපාලනය සඳහා වගකීම ;

(ආ) පනතේ විධිවිධාන ප්‍රකාරව හානිපූර්ණය සඳහා වූ හිමිකම්පෑමක් සාධාරණ ද නැද්ද, යන්න පිළිබඳව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දීම ;

(ඇ) මණ්ඩලයේ කර්තව්‍ය සහ වගකීම් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා එහි කාර්ය පටිපාටිය පාලනය කරන රීති සහ මාර්ගෝපදේශ සෑදීම සහ අනුගමනය කිරීම ;

(ඈ) හානිපූර්ණය සඳහා වූ හිමිකම්පෑම් විමර්ශනය කිරීම සහ මේ පනත යටතේ හානිපූර්ණය ගෙවීමට අදාළ වනුයේ යම් තැනැත්තකුගේ සාවද්‍යතාවය ද, එම තැනැත්තන් හඳුනාගැනීම සහ අරමුදලේ යථාතත්වයට පත්කිරීම සඳහා එම තැනැත්තන්ගෙන් අයකරගත යුතු මුදල් ප්‍රමාණය තීරණය කිරීම;

(ඉ) (ඈ) ඡේදය යටතේ අරමුදලට සිදු වූ අලාභය අයකර ගැනීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔහුට උපදෙස් දීම ;

(ඊ) අරමුදලේ ගිණුම්වලට අදාල වාර්තා සහ අරමුදල ක්‍රියාත්මකවීම පිළිගත් ප්‍රමිතිවලට අනුකූලව පවත්වාගෙන යනු ලබන්නේ ද යන්න විමර්ශනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ඒ සම්බන්ධයෙන් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දීම ;

(උ) මණ්ඩලය විසින් කටයුතු කරනු ලබන සියලු කාරණාවලට අදාළ වූ වාර්තාවල නිරවද්‍යතාවය, අංග සම්පූර්ණබව සහ ආරක්ෂාව පිළිබඳව සහතික කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම ;

(ඌ) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සහ මහ බැංකුව විසින් පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන සියළු මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම ;

(එ) අරමුදල මුදල් ලැබීම සහ අරමුදලින් මුදල් පිටතට යෑම පිළිබඳ ව නිතිපතා සමාලෝචනය කිරීම සහ යම් අහිතකර අවස්ථාවන් නිවැරදි කිරීම සඳහා උචිත පියවර ගැනීම; සහ

(ඒ) වාර්ෂික ඇස්තමේන්තුගත පරිපාලනමය වියදම් සමාලෝචනය කිරීමෙන් පසු සහ අවශ්‍ය නම් ප්‍රතිශෝධනය කිරීමෙන් පසු ඒවා අනුමත කිරීම.

මණ්ඩලයේ රැස්වීම.

15. (1) වැඩ වල ස්වභාවය සහ ප්‍රමාණය සැලකිල්ලට ගෙන අවශ්‍යයයි මණ්ඩලයේ සාමාජිකයන් විසින් සළකනු ලබන කවර හෝ අවස්ථාවක දී මණ්ඩලය රැස් විය යුතු අතර, අවම වශයෙන් අර්ධ වාර්ෂිකව ජනවාරි මස සහ ජුලි මාස වලදී මණ්ඩලය රැස්විය යුතු ය. සෑම වර්ෂයකම ජනවාරි මාසයේ දී මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු ය.

(2) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ලිඛිතව එක් සතියක දැනුම් දීම මගින් මණ්ඩලයේ රැස්වීමක් කැඳවනු ලැබිය හැකි ය ;

(3) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටින්නේ නම් මණ්ඩලයේ සෑම රැස්වීමක දීම ඔහු මුලසුන දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරාපත් කර ගනු ලබන සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය ;

(4) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා සණ පූර්ණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය ;

(5) සභාපතිවරයා හෝ මණ්ඩලයේ යම් රැස්වීමක දී මුලසුන දරන වෙනත් සාමාජිකයෙකුට තමාගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය ;

(6) මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන වලට යටත් ව මණ්ඩලයේ රැස්වීම් වලට අදාළ කාර්ය පටිපාටිය සහ එම රැස්වීම් වල කටයුතු සිදු කිරීම මණ්ඩලය විසින් පාලනය කල හැකිය ;

(7) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් මතභේදයක් ඇති වූ විට බහුතර සාමාජිකයන්ගේ තීරණයෙන් මණ්ඩලය බැඳී සිටිය යුතු අතර, එය බලාත්මක විය යුතු ය ;

(8) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් අවලංගු ලෙස සළකනු නොලැබිය යුතු ය ;

(9) මණ්ඩලයේ රැස්වීම් වල රැස්වීම් වාර්තා, නිවැරදි ලෙස පවත්වාගෙන යෑම, ඒවා බෙදා හැරීම සහ ඒවායේ භාරකාරත්වය සහ මණ්ඩලයේ කටයුතු වලට අදාළ සියළු වාර්තා පවත්වාගෙනයාම යන කරුණු සම්බන්ධයෙන් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් කටයුතු සැළැස්විය යුතු ය ;

අරමුදලේ මුද්‍රාව.

16. අරමුදලේ මුද්‍රාව –

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තකු භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය ;

(ඇ) මණ්ඩලයේ අනුමැතිය ඇතිව මිස, සහ තමන් පැමිණ සිටි බවට අදාළ ලේඛණයට අත්සන් තබන මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු සහ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ඉදිරිපිට දී හැර, කිසිම ලේඛනයකට අරමුදලේ මුද්‍රාව නොතැබිය යුතු ය.

හිමිකම පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මණ්ඩලයේ ආයතනික සහ ලේකම් අවශ්‍යතා සළසා දිය යුතු බව.

17. මණ්ඩලයේ සියලු පරිපාලන හා ලේකම් අවශ්‍යතා සපයා දීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වගකිව යුතු ය. මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු පාරිශ්‍රමික සහ දීමනා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් කලින් කල අනුමත කරනු ලබන අනුප්‍රමාණවලට අනුකූලව ගෙවිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

18. මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අනුප්‍රමාණවලට අනුව වූ පාරිශ්‍රමික හෝ දීමනා මණ්ඩලයේ සාමාජිකයන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

වාර්තා.

19. හානි පූර්ණය සඳහා වූ හිමිකම්පෑම්වලට අදාළ සියලු ලේඛන, ප්‍රකාශන තක්සේරු වාර්තා සහ වෙනත් වාර්තා ලබා ගැනීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වගකිව යුතු ය.

එම ලේඛන, ප්‍රකාශ සහ වාර්තා තම නිරීක්ෂණ සහ නිර්දේශ සහිතව මණ්ඩලයේ රැස්වීම්වලට නිවැරදි ව හා අංග සම්පූර්ණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වගකිව යුතු ය.

20. ලේඛන, ප්‍රකාශ, වාර්තා සහ විමර්ශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ද අරමුදල යථාපරිදි ක්‍රියාත්මක වන බවට සහතික වීම සඳහා නීති කෘත්‍යය පැවරීම සම්බන්ධයෙන් සහ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් මණ්ඩලයේ නිර්දේශ මත පසු කටයුතු ක්‍රියාමාර්ග සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වගකිව යුතු ය. පසු කටයුතු ක්‍රියාමාර්ග.

III වැනි කොටස

*හානිපූර්ණය*

21. පනතේ 58 වන වගන්තියේ (2) උප වගන්තියේ, 59 වන වගන්තියේ සහ 60 වන වගන්තියේ විධිවිධාන සැළකිල්ලට ගෙන අධිකරණයේ ආඥාවක් මත පමණක් හානිපූර්ණය කරනු ලැබිය යුතු ය. හානිපූර්ණය.

22. (1) හානිපූර්ණය සඳහා හිමිකම්පානු ලබන්නේ යම් ඉඩමක හෝ යම් ඉඩමක සම්බන්ධතාවක් පිළිබඳ වංචනික හෝ වැරදි සහගත හිමිකම් ලියාපදිංචිය සම්බන්ධයෙන් ද, එය සිදු වී අවුරුදු තුනක් ඇතුළත හානිපූර්ණය සඳහා හිමිකම්පාන තැනැත්තා විසින් එසේ හානිපූර්ණය සඳහා හිමිකම්පාමින් අධිකරණයේ නඩුවක් පවරනු ලැබිය යුතු ය. කාර්ය පටිපාටිය.

(2) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා එකී නඩුවට විත්තිකරු කරනු ලැබිය අතර, හිමිකම්පෑම් සිදුකරනු ලබන්නේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් කරන ලද වංචාවක ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ පාඩුවක් සම්බන්ධයෙන් ද, එම වංචාව සිදු කල හෝ ඊට දායක වූ තැනැත්තා හෝ තැනැත්තන් ද සම විත්තිකරුවන් කරනු ලැබිය යුතු ය.

23. වෙනත් කරුණු අතර, පැමිණිල්ලෙහි පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතු ය :– පැමිණිල්ල.

(අ) පාඩු සිදු වූ බවට හිමිකම්පාන තැනැත්තා හෝ තැනැත්තන්ගේ නම හෝ නම් ;

(ආ) පාඩුවක් සිදු වී ඇත්තේ, යම් ඉඩමක ලියාපදිංචි කිරීම නිසා ද එම ඉඩමේ හෝ එහි සම්බන්ධතාවයේ අනන්‍යතාවය ;

(ඇ) අලාභය සිදු කල බවට චෝදනා කරනු ලබන තැනැත්තා හෝ තැනැත්තන්ගේ නම හෝ නම් ;

(ඈ) සුදුසුකම්ලත් තක්සේරු කරුවකු විසින් තක්සේරු කරන ලද පාඩුව පිළිබඳ තක්සේරුව.

24. ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද උද්දේශිත පාඩුව පිළිබඳ තක්සේරුකරුවක්, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තක්සේරු කිරීම.

25. (1) හානිපූර්ණය ගෙවිය යුතු බවට අධිකරණය විසින් ආඥා කරනු ලබන අවස්ථාවක, අධිකරණයේ ආඥාවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත්කර ඇත්නම් මිස, එම අධිකරණ ආඥාවේ දින සිට මාස තුනක් ඇතුළත එම හානිපූර්ණය කරනු ලැබිය යුතු ය. මාස තුනක් ඇතුළත හානිපූර්ණය කල යුතු බව.

(2) එම හානිපූර්ණය කිරීම මාස තුනකට වැඩි කාලයක් ප්‍රමාද කරනු ලබන අවස්ථාවක, සම්පූර්ණ හානිපූර්ණ මුදල ගෙවා නිමවන තුරු එකී හානිපූර්ණ මුදල හෝ ඉතිරිව ඇති එහි ශේෂය මත නෛතික පොළිය ගෙවනු ලැබිය යුතු ය.

*හානිපූර්ණය කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය*

26. හානිපූර්ණය කිරීම සඳහා අධිකරණ ආඥාවක් ලැබුණ විට පහත දැක්වෙන විස්තර ඇතුළත් ප්‍රකාශයක් ද සමඟ හානිපූර්ණය ගෙවීම සඳහා වූ තම අනුමතිය හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමතිය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :– මුදල් ගෙවීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා සිටිය යුතු බව.

(අ) ප්‍රශ්නයට තුඩු දී ඇති ඉඩමේ අනන්‍යතාවය හෝ ඉඩමේ සම්බන්ධතාවයේ ස්වභාවය ;

(ආ) හානිපූර්ණය සඳහා වූ හිමිකම්පෑමට හේතු වූ ලියාපදිංචියට අදාළ ඉඩමේ හෝ ඉඩමේ සම්බන්ධතාවයේ අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් ;

(ඇ) අධිකරණයේ දී ඔප්පු කරන ලද හිමිකම්පෑමේ ස්වභාවය. විසඳිය යුතු ප්‍රශ්න සහ හිමිකම්පෑම් සඳහා හේතු සාධක වූ අනියම් සිද්ධිමය කරුණු ;

(ඈ) හානිපූර්ණය සඳහා හිමිකම්පා ඇති මුදල ;

(ඉ) මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන හානිපූර්ණ මුදල ;

(ඊ) හිමිකම්පෑම පිළිබඳ විමර්ශනයේ දී හෙළි වූ වැදගත් කරුණු ;

(උ) හිමිකම්පෑම සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳ වාර්තාවක් ;

(ඌ) හිමිකම්පා ඇති හානිපූර්ණය සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරු විසින් කරන ලද පාඩුව පිළිබඳ තක්සේරුකරුව;

(එ) ප්‍රධාන තක්සේරුකරු විසින් දෙන ලද හානිපූර්ණය පිළිබඳ අවසාන තක්සේරුව පිළිබඳව මණ්ඩලයේ සාමාජිකයන්ගේ නිරීක්ෂණවල සමාලෝචනයක් ;

(ඒ) හානිපූර්ණය සඳහා හිමිකම්පෑමට හේතු සාධක වූ අලාභය සඳහා වගකිවයුතු තැනැත්තන්ගේ නම් ;

(ඔ) (ඒ) ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති එක් එක් තැනැත්තාගේ වැරදි ක්‍රියාවල ස්වභාවය හා ප්‍රමාණය සහ එම තැනැත්තන්ගෙන් අයකර ගත යුතු බවට මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන අදාළ මුදල් ;

(ඕ) හානිපූර්ණය පිළිබඳ හිමිකම්පෑම සම්බන්ධයෙන් මණ්ඩලය විසින් පවත්වන ලද විමර්ෂනයේ වාර්තා; සහ

(ක) හිමිකම්පෑම් සම්බන්ධයෙන් අධිකරණයේ තීන්දුව

ප්‍රකාශයේ අන්තර්ගත විස්තර හා තොරතුරුවල නිරවද්‍යභාවය පිළිබඳව දැන ගැනීමෙන් පසු මණ්ඩලය විසින් එහි යෝජනා සම්මතයක් මගින් හානිපූර්ණය සඳහා වූ ගෙවීම අනුමත කරනු ලැබිය යුතු ය.

සහතිකය.

27. හානිපූර්ණය ගෙවීම අනුමත කරන මණ්ඩලයේ යෝජනා සම්මතය හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබීමේ දී, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ආර්.ජී.ටී/අයි.එෆ්/1 දරන ආකෘති පත්‍රයට සාරානුකූල වූ පිටපත් තුනකින් යුක්ත වූ සහතිකයක් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පිළියෙළ කළ යුතු ය.

එම සහතිකයට මණ්ඩලයේ සාමාජිකයකු හා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අත්සන් තැබිය යුතු ය. එකී සහතිකයේ පිටපත් එක බැගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහ අරමුදලේ ගිණුම පවත්වාගෙන යන බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, අධිකරණය විසින් නියම කරනු ලැබූ මුදල සඳහා හිමිකම්පාන්නාගේ නමට ලියන ලද චෙක්පතක් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අධිකාරණයේ තැන්පත් කළ යුතු ය.

ප්‍රතිකර්ම ක්‍රියා සිදු කල යුතු බව.

28. හානිපූර්ණය අවශ්‍ය වූ හේතු සහ අනාගතයේ දී හානිපූර්ණ මුදල් ගෙවීමට සිදුවිය හැකි වෙනත් සිද්ධිමය කරුණු සඳහා ප්‍රතිකර්ම යෙදීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතු ය.

ක්‍රියා මාර්ග ගත යුත්තේ යම් තැනැත්තන්ට එරෙහිවද එම තැනැත්තන්.

29. හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් —

(අ) හානිපූර්ණය කිරීමේ අවශ්‍යතාවය ඇති කළේ යම් තැනැත්තකුගේ වංචාවක් නිසා ද එම තැනැත්තාට එරෙහිව;

(ආ) හානිපූර්ණය කිරීමේ අවශ්‍යතාවය ඇති කළේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයෙකුගේ වංචාවක් හෝ අතපසු කිරීමක් නිසා ද එම නිලධරයාට එරෙහිව

නඩු පවරනු ලැබිය යුතු ය.

## IV වැනි කොටස

### අරමුදලේ මූල්‍ය පරිපාලනය

30. අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. — අරමුදලේ මුදල් වර්ෂය.

31. එක් එක් මාසය සඳහා මේ පනත යටතේ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබුණ සියලු ගාස්තුවලින් සියයට හතළිහක් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඊළඟ මාසයේ දහ වැනි දිනට පෙර අරමුදලේ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය. — ගාස්තුවලින් 40% ක් අරමුදලේ ගිණුමට ප්‍රේෂණය කළ යුතු බව.

32. 33 වැනි වගන්තියේ විධිවිධාන වලට යටත් ව, අධිකරණය විසින් ආඥා කරනු ලබන හානිපූර්ණ සිදු කිරීම සඳහා සහ රජයට ණය මුදල් ආපසු ගෙවීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අරමුදලේ ගිණුමේ ඇති මුදල් ප්‍රයෝජනයට ගත යුතු ය. — ගිණුමෙන් කරනු ලබන ගෙවීම.

33. 31 වැනි වගන්තිය යටතේ අරමුදලේ ගිණුමට ගෙවන ලද ගාස්තුවලින් සියයට විසිපහක් (25 %) පහත දැක්වෙන වියදම් පියවීමේ කාර්යය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ගිණුමට ගෙවනු ලැබිය යුතු ය:– — අරමුදල පරිපාලනය කිරීමේ දී දරන ලද වියදම්.

(අ) එවැනි අරමුදලක් මත සාමාන්‍යයෙන් අයකරනු ලබන මූල්‍ය සේවා ගාස්තු ;

(ආ) (i) වැරදි සහගත ලෙස හිමිකම් ලියාපදිංචිය සඳහා තුඩුදුන් වංචාවලට ;

(ii) හිමිකම් රෙජිස්ටරයේ වංචනික ලෙස හෝ නොසැළකිලිමත් ලෙස වැරදි තොරතුරු ඇතුළත් කිරීම සඳහා;

වගකිවයුතු තැනැත්තන්ගෙන් අලාභ අයකර ගැනීම සම්බන්ධයෙන් දරන ලද නීතිමය වියදම්;

(ඇ) රක්ෂණ යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම සඳහා සෘජුවම සේවයේ නියුක්ත කරන ලද කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ගෙවීම ;

(ඈ) අත්‍යවශ්‍ය කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය සඳහා මුදල් ගෙවීම ;

(ඉ) මණ්ඩලයේ සාමාජිකයන්ට දීමනා ගෙවීම ;

(ඊ) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් වියදම් සඳහා ගෙවීම ;

(උ) අරමුදලේ මුදල් විගණනය කිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත කරනු ලබන ගෙවීම්; සහ

(ඌ) පරිපාලන වියදම්.

34. පනත යටතේ ගෙවනු ලබන සියලු මුදල් වලින් සියයට හැටක් ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය. — ඒකාබද්ධ අරමුදලට මුදල් ගෙවීම.

35. (1) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරනු ලබන බැංකුවක අරමුදල සඳහා ගිණුමක් විවෘත කල යුතු ය. — අරමුදල සඳහා වූ බැංකු ගිණුම.

36. (1) (අ) අරමුදලේ ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යාමට කටයුතු සැළැස්වීම පිළිබඳ ව; — ගිණුම සහ මුදල් මාරු කිරීම.

(ආ) පනත යටතේ සෑම මසකම ගාස්තු එකතු කිරීම පිළිබඳ ව නිසි පරිදි ගිණුම් තැබීමට කටයුතු සැළැස්වීම පිළිබඳ ව ;

(ඇ) අරමුදලට මුදල් පැවරීමේ නිරවද්‍යතාව සහ එහි අදාළකම පිළිබඳ ව;

හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වගකිව යුතු ය.

(2) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ පොත්පත් තුලනය කිරීම සඳහා ඔහු විසින් කටයුතු සැළැස්විය යුතු අතර, දෙසැම්බර් තිස් එක් වන දින දක්වා අරමුදලේ වත්කම් හා බැරකම් පිළිබඳ සංක්ෂිප්ත සටහනක් ඇතුළත් ශේෂ පත්‍රයක් සහ ආදායම් හා වියදම් පිළිබඳ ගිණුමක් ඊළඟ මාර්තු තිස් එක් වන දිනට පෙර සකස් කිරීමට හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා කටයුතු සැළැස්විය යුතු ය.

(3) ආදායම් හා වියදම් පිළිබඳ ගිණුම හා ශේෂ පත්‍රය හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සහ මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් විසින් බලය පවරනු ලබන මණ්ඩලයේ සාමාජිකයකු විසින් අත්සන් කරනු ලැබිය යුතු ය.

ආයෝජන.

37. (1) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගෙන පමණක් අරමුදලේ මුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කල හැකිය.

(2) (අ) ඡේදයේ කාර්ය සඳහා මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ ද, මුදල් අමාත්‍යවරයාගේ ද, මහ බැංකුවේ ද උපදෙස් හා එකඟත්වය ලබාගත යුතු ය.

රක්ෂණ අරමුදල සඳහා වෙනම ගිණුමක්.

38. රක්ෂණ අරමුදල ක්‍රියාත්මක කිරීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තම පොත්පත් වල වෙනම ගිණුමක් පවත්වාගෙන යා යුතු ය.

ගෙවීම් අනුමත කිරීම.

39. මේ ගිණුමෙන් කරනු ලබන සෑම ගෙවීමක්ම හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අනුමත කළ යුතු අතර, එවැනි ගෙවීම් සහතික කිරීම සඳහා අතිරේක හෝ නියෝජ්‍ය හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයෙකුට බලය පැවරිය යුතු ය.

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් භාණ්ඩාගාර චක්‍රලේඛ අනුමත කළ යුතු බව.

40. දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් කලින් කල නිකුත් කරන ලද මහා භාණ්ඩාගාර චක්‍රලේඛ අනුගමනය කිරීම හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ කාර්ය වන්නේ ය.

## V වැනි කොටස

## විගණනය

විගණනය.

41. (1) සෑම වර්ෂයක ම, අරමුදලේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(2) විගණනය සඳහා ගිණුම් පොත් හා වාර්තා විගණකාධිපතිවරයා වෙත ලබා දිය යුතු ය.

(3) සෑම ගිණුම් වර්ෂයක් අවසන් වීමෙන් පසුව එළඹෙන මාස හතරක කාලය අවසන් වීමට පෙර, අරමුදලේ ගිණුම් සම්බන්ධයෙන් පහත දැක්වෙන ගිණුම් ප්‍රකාශ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු අතර, එහි පිටපතක් භාණ්ඩාගාරයේ නියාමන අංශයේ ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය :–

(අ) වර්ෂය තුළ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක් ;

(ආ) වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශයක් ;

(ඇ) වර්ෂය අවසානයේ දී වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයක් ;

(ඈ) අරමුදලේ බැරට මහ බැංකුවේ ඇති මුදල් ශේෂය සහතික කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන ප්‍රකාශයක් ;

(4) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) අරමුදලේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් දරන ලද වියදම් සඳහා ඔහුට අරමුදලින් මුදල් ගෙවනු ලැබිය යුතු ය.

## VI වැනි කොටස

### අරමුදල පරිපාලනය කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය

42. අරමුදල පරිපාලනය කිරීමට අදාලව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පහත දැක්වෙන කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු ය :– කාර්ය පටිපාටිය.

(අ) එක් එක් මාසය අවසානයේ දී මුදල් පොතේ ශේෂය, අරමුදලේ බැංකු ශේෂය සමඟ සැසඳිය යුතු ය.

(ආ) නිකුත් කරන ලද හිමිකම් සහතික ප්‍රමාණය වාර්තා කිරීම සඳහා සහ හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සලසන ලද සේවා වාර්තා කිරීම සඳහා අංක "ආර්.ජී.ටී./අයි.එෆ්.02" දරන අනුමත ආකෘති පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති පරිදි හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ප්‍රධාන කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන රෙජිස්ටර අංක "ආර්.ජී.ටී./අයි.එෆ්.03" දරන අනුමත ආකෘති පත්‍රයට සාරානුකූලව හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සති දෙකකට වරක් යවනු ලබන වාර්තාවලට අනුකූලව රෙජිස්ටරවල සටහන් තැබිය යුතු ය.

(ඇ) අංක "ආර්.ජී.ටී./අයි.එෆ්.03" දරන අනුමත ආකෘති පත්‍රයට සාරානුකූලව හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින් සති දෙකකට වරක් යවනු ලබන වාර්තාවේ පිටපතක් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ කාර්යාලයේ ගොනුකර තැබිය යුතු ය.

(ඈ) හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පොදු ආකෘති පත්‍ර 50 ට සාරානුකූලව මුදල් පොත පවත්වාගෙන යා යුතු ය.

(ඉ) සෑම දින දහ හතරක් (14) අවසානයේ දී ම හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කර ගන්නා මුදල්, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රධාන මුදල් පොතට වෙන් වශයෙන් හර කරනු ලැබිය යුතු ය.

(ඊ) කරන ලද සෑම ගෙවීමක් ම එක් එක් දිනය යටතේ බැර කිරීම් ලෙස ඇතුළත් කරනු ලැබිය යුතු ය. දිනය, ගෙවීම් වවුචරයේ වවුචර් අංකය, ගෙවීම් ලෙජරයේ විස්තර, පිටු අංකය, මුදල සහ ගෙවීම් සංකේතය මුදල් පොතේ බැර පැත්තේ සටහන් කළ යුතු ය.

(උ) අධිකරණයක් විසින් හානිපූර්ණය ගෙවීමක් සඳහා ආඥා කර ඇති අවස්ථාවක, හානි පූර්ණ ගෙවීම් සඳහා අංක "ආර්.ජී.ටී./අයි.එෆ්.04" දරන අනුමත ආකෘති පත්‍රයට සාරානුකූල වූ සහතිකයක්, හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් එම කාර්යාලයේ ගණකාධිකාරිවරයා වෙත නිකුත් කළ යුතු ය.

(ඌ) මාසය අවසානයේ දී –

(1) අය කරන ලද ගාස්තුවලින් සියයට හතළිහක් අරමුදලේ ගිණුමට මාරු කරනු ලැබිය යුතු ය. එම සියයට හතළිහෙන් (40%) සියයට විසිපහක් රක්ෂණ අරමුදල පරිපාලනය කිරීම සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ගිණුමට බැර කරනු ලැබිය යුතු ය. පරිපාලන ගාස්තු සඳහා හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත බැර කරන ලද සියයට විසි පහක (25%) මුදලින් ඉතිරිවන මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) ගිණුමට මාරු කරනු ලබන මුදල් අංක "ආර්.ජී.ටී./අයි.එෆ්.05" දරන අනුමත ආකෘති පත්‍රයට සාරානුකූලව වූ ආකෘති පත්‍රයකින් මාසිකව මාරු කරනු ලැබිය යුතු ය.

(3) ගාස්තුවලින් සියයට හැටක් (60%) ඒකාබද්ධ අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය; සහ

(4) සෑම මසක ම අවසානයේ දී මුදල් පොත් හෝ බැංකු ගිණුමේ කිසිම ශේෂයක් නොතිබිය යුතු ය.

## VII වැනි කොටස

### අර්ථ නිරූපණය

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස –

"අමාත්‍යවරයා" යන්නෙන් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුව භාරව සිටින අමාත්‍යවරයා අදහස් වේ.

"පනත" යන්නෙන් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත අදහස් වේ.

"අනුමත ආකෘති පත්‍රය" යන්නෙන් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රයක් අදහස් වේ.

*ආර්. ජී. ටී. අයි. එෆ්./1*
*(27 වැනි වගන්තිය)*

**හානිපූර්ණය කිරීම සඳහා වූ ගෙවීම් සඳහා අනුමැතිය පිළිබඳ සහතිකය**

*1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 62 වැනි වගන්තිය*

රක්ෂණ අරමුදලේ කළමණාකරන මණ්ඩලය ............................................දින රැස් වූ බවත් පහත දැක්වෙන ලැයිස්තුවේ අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ට පහත දැක්වෙන හානිපූර්ණ ගෙවීම් සිදුකිරීමට අනුමත කර ඇති බවත් මින් සහතික කරමි.

| අංකය | ඉඩම් කොටසේ අංකය | තැනැත්තාගේ නම | ලිපිනය | අධිකරණ ආඥාවේ අංකය හා දිනය | අනුමත හානිපූර්ණ මුදල | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

අත්සන : ........................ ........................ ........................ ........................ ........................ ........................
සභාපති සාමාජික සාමාජික සාමාජික සාමාජික සාමාජික

කළමනාකරණ මණ්ඩලය:

නම : ..................................... .................... .......................... ....................... ........................ ........................
දිනය : .........................................

ආකෘතිපත්‍ර අංක ආර්.ජී.ටී./අයි.එෆ්02
(42 වැනි වගන්තිය)

ප්‍රධාන කාර්යාලය
හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් යවන ලද වාර්තාවලට අනුකූලව එකතුකරගත් මුදල් පිළිබඳ රෙජිස්ටරය එකතු කිරීම

| මාසය | වාර්තාවේ අංකය | කොට්ඨාසය | සහතික නිකුත් කිරීම රු. | සහතික නැවත නිකුත් කිරීම රු. | රෙජිස්ට්‍රාර් පරීක්ෂා කිරීම රු. | ලියාපදිංචි ගාස්තු | උධෘත නිකුත් කිරීම රු. | වෙනත් රු. | සම්පූර්ණ මුදල රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අ<br>ආ<br>ඇ<br>ඈ<br>ඉ<br>ඊ | | | | | | | |
| මාසික එකතුව | | | | | | | | | |

ශ්‍රී ලංකා මහ බැංකුව
මාරුකිරීම

එකතු කල මුදල : ..............................................................
රක්ෂණ අරමුදල් ගිණුමට
මාරු කළ ප්‍රතිශතය

ඒකාබද්ධ අරමුදලට මාරු කළ යුතු මුදල : ..............................

හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ගිණුම : ............

සකස් කරන ලද්දේ: .............

හරි වැරදි බැලීම : .............

.....................
ගණකාධිකාරී

*ආකෘති පත්‍ර අංක ආර්.ජී.ටී./අයි.එෆ්. 03*
*(42 වැනි වගන්තිය)*

හි.පි.රෙ.ජ.
හි.පි.රෙ.ජ. දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

**නිකුත් කළ හිමිකම් සහතික පිළිබඳ සහ සළසන ලද සේවා පිළිබඳව**
**සති දෙකකට වරක් යවනු ලබන වාර්තාව ( ....................................................එල් ආර්)**

**එකතුකළ ගාස්තු පිළිබඳ විස්තර**

| වාර්තාවේ අනුක්‍රමික අංකය | නිකුත්කළ හිමිකම් සහතිකවල අංක | සහතික පිළිබඳ විස්තර සහ සළසන ලද සේවා | දිනය | පී. වී. අංකය | ගිණුම් අංකය |
|---|---|---|---|---|---|
| | | | | | |
| *දින 14 ක් ඇතුළත එකතු කරගත් මුදල* | | | | | |

ඉහත දක්වා ඇති විස්තර අනුව එකතු කරගත් රු. ........................................ක සම්පූර්ණ මුදල ලංකා බැංකුවේ ටැබ්ප්‍රබේන් ශාඛාවේ අංක.................................. දරන ගිණුමට ප්‍රේෂණය කළ බව මම මෙයින් සහතික කරමි.

හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්ගේ අත්සන ...........................

නම: ..................................................................

කොට්ඨාසය: ...........................................................

*සැ. කි.: ගෙවීම් වවුචරයේ 3 වැනි පිටපත ඇමිණිය යුතු ය.*

ආකෘතිපත්‍ර අංක ආර්.ජී.ටී./අයි.එෆ්.04
(42 වැනි වගන්තිය)

හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ
ප්‍රධාන කාර්යාලය.
.....................................බැංකුව වෙත
.....................................

## හානිපූර්ණය සහ අනිකුත් වියදම් ගෙවීම සඳහා සහතිකය
## අධිකරණ ආඥාවේ විස්තර

| දිනය | හානිපූර්ණය ප්‍රදානය කිරීමට හේතු | නියමය කල දිනය | නියමයේ යොමු අංකය | අධිකරණය | ලැබුම්කරුගේ නම | අධිකරණ ආඥාව මගින් ගෙවීමට නියම කළ මුදල |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

.................................................ට රු...........................................මුදලක් ගෙවන ලෙස...................................අධිකරණය විසින්.......................................නියම කර ඇති අතර ඒ පිළිබඳ විස්තර ඉහතින් දැක්වේ.

.................................................අධිකරණය මගින් හානිපූර්ණය වශයෙන් රු. ..............................................................ක මුදලක් ගෙවීමට අධිකරණ ආඥාවක් ලබා දී ඇති බව මා මෙයින් සහතික කරමි.

.........................................................................
හි. පි. රෙ. ජ. අත්සන

පිටපත: මහ බැංකුව

ආකෘති පත්‍ර අංකඃ ආර්.ජී.ටී./අයි.එෆ් 05
(42 වැනි වගන්තිය)

මගේ අංකය :
ශ්‍රී. පිළබඳ රෙ. ජ. කාර්යාලය,
කොළඹ 11.
2009..........................

...........................................................................
ශ්‍රී ලංකා මහ බැංකුව

රක්ෂණ අරමුදල
(1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත)

ඉහත කී අරමුදලට මාරු කිරීම සඳහා රු. ..........................................................................ක මුදලක් සඳහා ............................
දින අංක ..............................................................දරන චෙක්පත මේ සමග එවමි.

ගණකාධිකාරි,
හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ දෙපාර්තමේන්තුව.

09-244

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.